# 2022.07.12 මහා සභා රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රීවරුන්

01.ප්‍රාදේශීය සභා ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා
02.ප්‍රාදේශීය සභා ගරු උප සභාපති රංජිත් ආනන්ද බණ්ඩාර මහතා
03.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා
04.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා
05.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ටී.එම්. ජාබීර් මහතා
06.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා
07.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.ඒ.විරාජ් මධුසංක විජේසිංහ මහතා
08.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී. නිමාලි දිල්හානි මෙනවිය.
09.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.සුනිල් හේමචන්ද්‍ර දිසානායක මහතා
10. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.බී.එම්.ඉන්දික ප්‍රදීප් රාජගුරු මහතා
11. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඒ.චමින්ද ප්‍රදීප් මල්ලවආරච්චි මහතා
12.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ජයන්ත හේරත් මහතා
13. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.නන්දසිරි මහතා
14. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රදීප් සුජීව හේරත් මහතා
15. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.අමරසිංහ මහතා
16. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ජී.සුනිල් බණ්ඩාර හපුගම්මන මහතා
17.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.එම්.ප්‍රදී සමන් කුමාරසිරි තෙන්නකෝන් මහතා
18.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි. සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
19.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්ලිව්.ඒ.දනුක සුභාෂන් වනසිංහ මහතා
20.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා
21.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා
22.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.ඒ.බංඩාරමැණිකා මහත්මිය
23.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.එන්.පද්මා වීරසිංහ මහත්මිය
24. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය
25.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා
26.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි එම්.නිශාන්ති ගුණතිලක මහත්මිය
27.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනි බී.එම්.ගීතා කුමාරි බාලසූරිය මහත්මිය
28.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.විරාජ් මලින්ද ඩයස් මහතා
29.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා
30.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ජේ.පී.නිශාන්ත දේශප්‍රිය ජයලත් මහතා
31.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.උදේශිකා මාධවී හේරත් මහත්මිය
32.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා
33.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී පී.එම්.කුමාරසේන ජයලත් මහතා
34.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී.රංජිත් ප්‍රේමලාල් මහතා
35.ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා

**<u>රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන්</u>**

01. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා
02. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි ඒ.පී.සචින්තා අමාලි මෙනවිය
03. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා

**ආගම සිහි කිරීම.**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය, ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූලව ආරම්භ කරන ලදී.2022 ජුලි මස මහා සභා රැස්වීමට සහභාගී වන ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මණ්ඩලය ,ලේකම් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගී වී සිටින සියලු දෙනාට ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## 01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

**2022.06.15 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

2022.06.15 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාවේ අඩුපාඩු ඇත්නම් එය පෙන්වා දෙන ලෙසත් , එසේ නොමැති නම් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලෙසත් දන්වා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනි එල්.එම්.ගුණරත්මැණිකා මහත්මිය- (එ.ජා.ප.)</u>**

2022.06.15 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා-(එ.ජ.නි.ස.)</u>**

2022.06.15 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ඒ අනුව 2022.06.15 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.06.15 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා විසින් 2022.06.15 දින මහා සභාවේ ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සං නිවේදන.

## I. නිවාඩු අනුමත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී ඒ.පී. සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

අද දින බහුතර මන්ත්‍රීමණ්ඩලයක් පැමිණ සිටිනවා.ඒක යහපත් තත්ත්වයක්.ඔබතුමලා ඔබතුමාලගේ කොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් මාසයකට එක් වරක් පමණක් ඇති හෙයින් මාසික සභා රැස්වීමට පැමිණිය

යුතුයි. මෙය අත්‍යාවශ්‍ය කාරණාවක්. තවද මුදල් කමිටු වැනි කමිටු හා රැස්වීම් පැවැත්වෙන අවස්ථාවන්හි ඔබතුමන්ලාගේ පැමිණීම අනිවාර්යය වේ. ඔබතුමන්ලාට පැමිණීමට නොහැකි නම් දුරකථනයෙන් හෝ ලිඛිතව හෝ මා දැනුවත් කල යුතුයි. එසේ නොකරනවා නම් එම මන්ත්‍රීවරයාට නිවාඩු දැමීමට සිදුවනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පී.සරත්චන්ද්‍ර ජයතිලක මහතා( පො.ජ.පෙ.)**</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.පී. සචින්තා අමාලි මෙනවිය,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මා යෝජනා කරනවා.

විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි ,පසුගිය කාලයේ නම් ගරු සභාව පවත්වන අවස්ථාවල ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ පැමිණීම 100%ක්ම තිබුණා. නමුත් මේ පවතින තත්වයත් එක්ක විවිධ අපහසුතා මධ්‍යයේ තමයි මේ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා පැමිණෙන්නේ. විශේෂයෙන්ම ඉන්ධන හා ප්‍රවාහන අපහසුතා නිසා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල මු.කො.)**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී. සචින්තා අමාලි මෙනවිය, ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අමිල නිශාන්ත අරවින්ද මහතා,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඒ.පී. සචින්තා අමාලි මෙනවිය ,ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වයි.ජී.සංජීව කරුණාසාගර මහතා වෙත අද දින සභාවේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

<u>**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**</u>

බොහොම ස්තූතියි.අපේ ප්‍රාදේශීය සභාවේ කාර්යමණ්ඩලයත් මේ ප්‍රශ්නයට මුහුණ දීලා තියෙනවා.ඉන්ධන ප්‍රශ්නය නිසා සේවයට එන්න බැරි වෙලා තියෙනවා.රජයේ සේවකයන් විධියට පොදු ප්‍රවාහනය වගේ විකල්ප ක්‍රම ඔස්සේ හෝ සේවයට වාර්තා කළයුතුයි. ගරු මන්ත්‍රීවරුන්ටත් මෙය පොදුයි.මේක බොහොම කණගාටුදායි තත්වයක්. අපිට ගරු සභාවේ න්‍යාය පත්‍රය බෙදා දීමටවත් නොහැකි තත්වයක් උදා වුණා. සමහර මන්ත්‍රීවරු ඉල්ලීමක් කළා ප්‍රාදේශීය සභාවෙන් හෝ ඉන්ධන ලබා දෙන්න කියලා.එහෙම දෙන්නවත් ඉන්ධන නෑ.මම ලේකම්තුමා සමඟ ඉන්ධන පිරවුම්හල්වලට ගියා ඉන්ධන ගන්න. විශේෂයෙන්ම ලේකම්තුමා ගොඩක් උත්සහා කළා ඉන්ධන ප්‍රාදේශීය සභාවට හෝ ලබාගන්න.එහෙම පහසුකම් අපිට ලැබිලා නෑ. අපි ඉවසීමෙන් ක්‍රියා කරමු. ඉදිරියේදී ඒ තත්වය විසඳේවි.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ. නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා( එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමා, ඉවසන්න නම් පුළුවන් කිසි ප්‍රශ්නයක් නෑ. ඉවසීමේත් සීමාවක් තියෙනවා.මටනම් එන්න පෙට්‍රල් නැති නිසා පයින්ම ආවා.මේ මන්ත්‍රීමණ්ඩලය පැමිණීම අත්‍යාවශ්‍යයි.ඒක ඇත්ත.කටුමුළුවේ ඉඳලා එනවානම් බස් කීයක එන්න ඕනද? මේ මන්ත්‍රීතුමිය බස් රථයෙන් එනවා.නමුත් අද උදේ බස් එකට ගන්නෙත් නෑ. මේක ඔබතුමා ඔබතුමාගේ බලය පාවිච්චි කළයුතු අවස්ථාවක්. අපේ පඬුවස්නුවර ආසනය තුළ අපි පරිසර බලපත්‍ර නිකුත් කරන ඉන්ධන පිරවුම්හල් 07ක් තියෙනවා. අනිත් අයට ප්‍රශ්නයක් නෑ. නමුත් මේ නගරය පිරිසිදු කරන කම්කරුවා නාවොත් කවුද මේ නගරය පිරිසිදු කරන්නේ?ඉතින් මේකට නිසි ක්‍රමවේදයක් තිබිය යුතුයිනේ. ඒත් සමහරු හොරෙන් තෙල් අරගෙන ලීටරේ රු.1000.00 ගානේ විකුණනවා.ඒක මම ප්‍රසිද්ධියේ කියනවා.අපිට තෙල් නොදුන්නොත් ඉදිරියේදි අපිටත් යම් යම් පියවරයන් ගන්න සිද්ධ වෙනවා කියන්න. අපි සාධාරණ ඉල්ලීමක් කරන්නේ.අපිට තෙල් ලීටර 50ක් දෙන්න කියන්න.එක ලීටරය රු.2500.00 ට දීලා හරි ප්‍රාදේශීය සභාවේ ඇතුළේ පිරවුම්හලක් කරන්න බැරිකමක් නෑ. ඒත් අපි එහෙම කරන්නේ නෑ. ඒ නිසා ඔබතුමා දැනුවත් කිරීමක් කරන්න. අපි ලිඛිතව කියමු ඊළඟ සැරේ එයට ඔබතුමාගේ බලය පාවිච්චි කරනවා කියලා. වෙන කළයුතු දෙයක් නෑ.

<u>**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩී.මනෝ කුමාර එදිරිසිංහ මහතා( එ.ජා.ප.)**</u>

ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් කරා මේ ඉන්ධන ප්‍රශ්නය පිළිබඳව.ඒ ගැන දැන් සාකච්ඡා කළ නිසා මම කතා කරන්නම්.සමුපකාර ඉන්ධන පිරවුම්හල ගැන කතා කරලා වැඩක් නෑ. ගරු නිමල් දයානන්ද මන්ත්‍රීතුමත් මමත් ඊ 12.00ට විතර අපි නගරයට එන ගමන් යතුරුපැදියෙන් ගියා සමූපකාර ඉන්ධන පිරවුම්හලට.බලනකොට භූමිතෙල් හා ඩීසල් කෑන්

පිටින් පිටිපස්සෙන් අදිනවා.අපි දෙන්නා ඇස් දෙකට දැක්කා.ගරු සභාපතිතුමා කොතරම් හොඳ වුනත් එතුමාගේ සම්පූර්ණ බලය අතට අරන් තියෙන්නේ එතුමා නෙවෙයි උපසභාපති. අවසානෙට සමූපකාරයේ බලය අරන් තියෙනවා පොම්පකරුවෝ.පොම්පකරුවන්ට ඕනවිදියට තමා පිරවුම්හල නඩත්තු වෙන්නේ. අපි ස්තූතිවන්ත වෙන්න ඕන ලේකම්තුමාට. මමත් රංජිත් මන්ත්‍රීතුමා හා නන්දසිරි මන්ත්‍රීතුමත් බලාගෙන ඉද්දි සමූපකාරේ ලොකු වෑන් එකක් ඇවිල්ලා චූටි චූටි කෑන් වලට ඇතුලේ තෙල් පුරෝනකොට අර ජනතාව එළියේ.ඊට පස්සේ තමයි එතැන ප්‍රශ්නයක් ඇතිවුණේ.අපි ලේකම්තුමාත් එක්ක ගිහින් කතා කරලා තමයි ප්‍රාදේශීය සභාවේ කම්කරුවන්ට තෙල් ගන්න අවස්ථාව හදලා දුන්නේ. නැත්නම් සමූපකාර ඉන්ධන පිරවුම්හලේ කිසිම පිළිවෙලක්, පරිපාලනයක් නෑ. මම ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙන්න ඕන එතුමා නිසා තමයි මන්ත්‍රීතුමන්ලාට තෙල් ටිකක් ගන්න පුළුවන් වුනේ.අනිත් එක පිරවුම්හලක්වත් උදව් කළේ නෑ. සමූපකාරයේ ප්‍රධානියාට කොන්දක් නෑ පිළිවෙලකට වැඩක් කරන්න. කළුබංඩා මහත්තයාගේ ඉන්ධන පිරවුම්හලේ තමයි අපිට උදව් නොකළත් නිසි පිළිවෙලකට තෙල් බෙදා හැරියේ. ප්‍රාදේශීය සභාව කියන්නේ අත්‍යාවශ්‍යය තැනක්. පිරිසිදු කිරීමේ පටන් සියල්ල කරන්නේ එතැනින්. ඔවුන්ට එන්න ක්‍රමයක් තියෙන්න ඕනා. පැමිණීමට සහනයක් ලබා දෙන්න ඒ වගේම ගරු සභාපතිතුමනි ඔබතුමාගේ බලය පාවිච්චි කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ටී.ආර්.එම්.අපර්ණ නිලුපුල් සේනාරත්න මහතා( එ.ජ.නි.ස.)</u>

ගරු සභාපතිතුමනි, සියලු දෙනාම මුහුණ දීලා තියෙන්නේ ව්‍යාකූල තත්වයකට. අපි සභාවක් විදියට පහුගිය කාලවකවානුවේම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු පිරිස දැඩි සේ මහන්සි වුණා මේ තත්වය කළමණාකරනය කරගන්න. සභාවක් විදියට අපි ගනුදෙනු කරන ආයතනයක් තමයි සමූපකාරය. ගරු සභාපතිතුමා අපි සමූපකාරයේ නිලධාරීන් සමග සාකච්ඡා කරලා හරි පරිපාලනයට හෝ අත්‍යවශ්‍ය කටයුතුවලට හෝ අවශ්‍ය ඉන්ධන මේ අවස්ථාවේ සපයා ගැනීමට හැකිනම් වටිනවා. නගරයේ තිබෙන පිරවුම්හල් එක්ක බලද්දී කරුනාරත්න මහතාගේ පිරවුම්හලේ උදේ තෙල් ලීටර 400ක් පමණ තියෙනවා කීවා. හැබැයි බලනකොට රාත්‍රියේ පෙට්‍රල් ප්‍රමාණයක් නිකුත් කරනකොට ලීටර 10000කට එහා ප්‍රමාණයක් දීලා තිබුණා.අවසානයේ අපේ ප්‍රදේශයේ පුද්ගලයෙකුට පහරදීලා මරණාසන්න තුවාල වෙලා රෝහල්ගත කරන්නත් සිදුවුණා. මේ ඉන්ධන දීර්ඝකාලීනව ගබඩා කරලා තිබුණු ඉන්ධන ප්‍රමාණයක්.ඉන්ධනහල්වල මේ වගේ අක්‍රමිකතා සිදුවෙනවා. තාමත් කිසිම ඉන්ධනහලකට ඉන්ධන ලැබිලා නෑ. හැබැයි ඉන්ධන තියෙනවා. අදත් මම දැක්කා ඩීසල් පෝලිමේ රාජ්‍ය ආයතනවල වාහන තියෙනවා. ඒ කියන්නේ මේ තුළ සංචිත විදියට ඉන්ධන ප්‍රමාණයක් තියෙනවා. රජයේ ආයතනයක් විදියට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට ඉන්ධන ලබා ගැනීමේ ක්‍රමවේදයක් පවතින අරගලකාරී තත්වයත් එක්ක ජනතාව ප්‍රකෝපකාරී නොවන ලෙස ගරු සභාපතිවරයා විදියට ආයතන හිමිකරුවන් සමග කතාකළයුතුයි.එමගින් ප්‍රාදේශීය සභාවේ කටයුතු යම්තාක් දුරකට ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සලසා ගන්නා ලෙස ගරු සභාවේ මන්ත්‍රීවරු හැටියට ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පි.සරත්චන්ද්‍ර ජයතිලක මහතා( ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මම නම් අදහස් කරන්නේ, ප්‍රධාන මහා සභාවක් හා කමිටු රැස්වීමකුත් තියෙනවා. මේ ගරු මන්ත්‍රීවරුනුත් ඉන් එකකට හෝ දෙකටම ඉන්නවා. ඒ නිසා මාසෙකට එකවතාවක් කාල වේලාව අරගෙන මේ දෙක පවත්වමු. ඒක ඇත්තටම අපටත් විශාල පහසුවක්. මොකද පෙට්‍රල් ලීටර 1ක් හෝ 2ක් අරගෙන ප්‍රාදේශීය සභාවට කිහිප වතාවක් ආවොත් ඒක මගටම ඉවරවෙනවා.බස් එකේ එන්නත් බෑ, .ඉන්ධනහල්වල පෝලිමේ ඉන්නත් බෑ දැන් තිබෙන තත්වය නිසා. මේක අපි හැමෝම මුහුණදෙන ප්‍රශ්නයක්.ඒ නිසා ලේකම්තුමා එක්ක කතා කරලා ඔබතුමා zoom තාක්ෂණය යොදාගෙන හෝ මෙයට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න. මෙය අපේ වගකීමක් බව අපි දන්නවා. ජනතාව අපිට වගකීමක් පවරලා තියෙනවා. එය ඉෂ්ට කරන්න අපි බැඳිලා ඉන්නවා. නමුත් එය ඉටු කරගන්න ක්‍රමයක් නැතිනම් අපිත් අසරණ වෙනවා. මන්ත්‍රීවරයෙකුට බස් එකේ එන්නත් බෑ, .ඉන්ධනහල්වල පෝලිමේ ඉන්නත් බෑ තර්ජනය කරනවානේ ගරු සභාපතිතුමනි, මෙහිදී සැබෑ තත්වය අපි තේරුම් ගතයුතුයිනේ.අපිට ගෙවල්වලත් ඉන්න බැරි තත්වයක් තියෙද්දී අපි අපහසුවෙන්නේ මෙයටත් සහභාගීවෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමා සුදුසු ක්‍රමයක් හදලා අපිටත් කියන්න.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පවතින තත්වය මත මේ ඉන්ධන අර්බුදය අපට විතරක් නෙවෙයි සියලු ආයතනවලට බලපෑ ප්‍රශ්නයක්. හැම පුද්ගලයෙක්ම මුහුණදුන් ප්‍රශ්නයක්. හැම සේවයක්ම අඩපණ වෙලා තියෙනවා මේ ඉන්ධන ප්‍රශ්නය නිසා. අපිට ප්‍රාදේශීය සභාවේ කටයුතුවලට තෙල් ටික ලැබෙනවා. ප්‍රාදේශීය සභාවේ මේ ට්‍රැක්ටර්වලට ගලිබවුසර්වලට ආදියට
ඉන්ධන ලැබෙනවා. නමුත් ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතාවයන්ට තෙල් ලැබෙනවා. ඉන්ධන වැඩිපුර දහනයවන මෝටරග්‍රේඩරය, JCB යන්ත්‍ර වගේ දේවල්වලින් කෙරෙන වැඩ මේ වෙද්දි නවත්තලා තියෙනවා. . නමුත් මේ සේවක මණ්ඩලයට හා ගරු මන්ත්‍රී මණ්ඩලයට ගමන් පහසුව තකා පුද්ගලික අවශ්‍යතාවයට ඉන්ධන ලබාදීමේ ගැටලුවක්

තියෙනවා. අපිට ඒකට ඉල්ලීමක් කරන්න පුළුවන්කමකුත් නෑ. නමුත් අපි ඊටත් උපරිම උත්සාහයක් අරන් තියෙනවා. හැබැයි සභාවේ අවශ්‍යතාවයන්ට ඉන්ධන ටික අපිට ලැබෙනවා. අපි උපරිම උත්සාහයක් අරන් තියනවා මන්ත්‍රීවරුන්ට තෙල් ලබාදීමට.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.පි.සරත්චන්ද්‍ර ජයතිලක මහතා( ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>

සමාවෙන්න,ගරු සභාපතිතුමා කියනවා ප්‍රාදේශීය සභාවේ යන්ත්‍රවලට වාහනවලට ඉන්ධන ලැබෙනවා කියලා. නමුත් ඒවායේ වැඩ කරන රියදුරු මහත්වරුන්ටවත් අපට නැතත් තෙල් ටික ලබාදෙන්න.මොකද ඔවුන් මේ ප්‍රාදේශීය සභාව ගැන කැක්කුමක් ඇතිව වැඩ කරන මිනිස්සු. සමහරු එන්නේ යන්නේ පාපැදියෙන් දැන්. ඒක කරන්න අමාරු දෙයක්. ඒ නිසා සමහරු එන්න බෑ කියනවා.ඒ නිසා ඔවුන්ටවත් ඉන්ධන ලබාදෙන්න.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා පෙ.ව.10.41 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

ගරු මන්ත්‍රී ආර්.පි.සරත්චන්ද්‍ර ජයතිලක මන්ත්‍රීතුමා, අපි ඒ රියදුරු මහත්වරුන්ට අවස්ථා හතරකදී ඉන්ධන ලබාදීලා තියෙනවා. සේවයට එන්න සහ නිවසට යන්න. ඒ නිසා කාටවත් චෝදනා කරන්න බෑ, ඉන්ධන නැති නිසා සේවයට එන්න බෑ කියලා. ගරු මන්ත්‍රීතුමා අපි ඒ යුතුකම ඉෂ්ට කරලා තියෙන්නේ.ඉදිරියේදී අලුත් අගමැතිවරයෙක් ජනාධිපතිවරයෙක් යටතේ මේ විදුලි, ඉන්ධන, ගෑස්, භාණ්ඩවල මිල අඩුවීම පිළිබඳ ප්‍රශ්න විසඳේවි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.එම්.අජිත් චන්ද්‍රරත්න මහතා පෙ.ව.10.43 ට පමණ ගරු සභාවට පැමිණියා.

## II.පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභාගත කිරීම.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභාගත කිරීම සඳහා මා විසින් ගරු සභාවට ඉදිරිපත් කරනවා.එම වාර්තාවේ මතය පහත සඳහන් අයුරින් ඉදිරිපත් කර තිබෙනවා.

<u>තත්ත්වාගණනය කළ මතය</u>

පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කල යුතු මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට පඹුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.**

## III. හෙට්ටිපොල සතිපොල ගව මස් වෙළඳසැලෙන් ඉවත්වීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැලේ 2022 වර්ෂයේ බදුකරු වන කලහේනවැව ,කිරිමැටියාව පදිංචි එම්.ආර්.එම්. සනූල් යන අය විසින් 2022.06.28 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, 2022.07.01 දින සිට සිට ඉහත නම් සඳහන් අයගෙන් බිල් කිරීම නතර කර ගවමස් වෙළඳසැල සභාවට පවරා ගැනීමත්,ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු සියලු ගාස්තු අය කිරීමත්,බදු කරු ගිවිසුමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමත්,අදාල ගවමස් වෙළඳසැල යම් පුද්ගලයෙකු නැවත ඉල්ලුම් කරන්නේ නම් අවම ලංසුව පදනම් කරගෙන අයකර ගත යුතු ගාස්තු එකවර අයකර ඉදිරි මාස කිහිපය සඳහා ලබා දීමත් සුදුසු බවට යෝජනා සම්මත කර ගන්නා ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයට දන්වා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ. නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා( එ.ජා.ප.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැලේ 2022 වර්ෂයේ බදුකරු වන කලහේනවැව ,කිරිමැටියාව පදිංචි එම්.ආර්.එම්. සනූල් යන අය විසින් 2022.06.28 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, 2022.07.01 දින සිට සිට ඉහත නම් සඳහන් අයගෙන් බිල් කිරීම නතර කර ගවමස් වෙළඳසැල සභාවට පවරා ගැනීමත්,ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු සියලු ගාස්තු අය කිරීමත්,බදු කරු ගිවිසුමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමත්,අදාල ගවමස් වෙළඳසැල යම් පුද්ගලයෙකු නැවත ඉල්ලුම් කරන්නේ නම් අවම ලංසුව පදනම් කරගෙන අයකර ගත යුතු ගාස්තු එකවර අයකර ඉදිරි මාස කිහිපය සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා නරනවා. ගරු සභාපතිතුමා, අපේ මේ ගව සෝතකාගාරය බදුකරුවන් විසින් මේ මස සිට ඉවත් කරගන්නවා කියලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයත් දැනුවත් කරන්න.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා( එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැලේ 2022 වර්ෂයේ බදුකරු වන කලහේනවැව ,කිරිමැටියාව පදිංචි එම්.ආර්.එම්. සනූල් යන අය විසින් 2022.06.28 දාතමින් ලිපියක් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, 2022.07.01 දින සිට සිට ඉහත නම් සඳහන් අයගෙන් බිල් කිරීම නතර කර ගවමස් වෙළඳසැල සභාවට පවරා ගැනීමත්,ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු සියලු ගාස්තු අය කිරීමත්,බදු කරු ගිවිසුමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමත්,අදාල ගවමස් වෙළඳසැල යම් පුද්ගලයෙකු නැවත ඉල්ලුම් කරන්නේ නම් අවම ලංසුව පදනම් කරගෙන අයකර ගත යුතු ගාස්තු එකවර අයකර ඉදිරි මාස කිහිපය සඳහා ලබා දීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැලේ 2022 වර්ෂයේ බදුකරු වන කලහේනවැව ,කිරිමැටියාව පදිංචි එම්.ආර්.එම්. සනූල් යන අය විසින් 2022.06.28 දාතමින් ලිපියක් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, 2022.07.01 දින සිට සිට ඉහත නම් සඳහන් අයගෙන් බිල් කිරීම නතර කර ගවමස් වෙළඳසැල සභාවට පවරා ගැනීමත්,ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු සියලු ගාස්තු අය කිරීමත්,බදු කරු ගිවිසුමෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමත්,අදාල ගවමස් වෙළඳසැල යම් පුද්ගලයෙකු නැවත ඉල්ලුම් කරන්නේ නම් අවම ලංසුව පදනම් කරගෙන අයකර ගත යුතු ගාස්තු එකවර අයකර ඉදිරි මාස කිහිපය සඳහා ලබා දීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## IV. හෙට්ටිපොල සතිපොල ගව මස් වෙළඳසැල බදු ලබා ගැනීම සම්බන්ධව.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැල 2022 වර්ෂයට බදු ලබා ගැනීමේ ජයග්‍රාහී දෙවන ලංසුකරු වන මඩිගේ අනුක්කනේ,සුනන්දපුර පදිංචි එම්.ජේ.අමීන් යන අය විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, එම අය වෙත චක්‍රලේඛන ප්‍රකාරව විධිමත් ගාස්තු අයකර හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැල බදු ලබා දීමට යෝජනා සම්මත කර ගන්නා ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයට දන්වා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ.නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා - (එ.ජා.ප.)</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැල 2022 වර්ෂයට බදු ලබා ගැනීමේ ජයග්‍රාහී දෙවන ලංසුකරු වන මඩිගේ අනුක්කනේ,සුනන්දපුර පදිංචි එම්.ජේ.අමීන් යන අය විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, එම අය වෙත 2022.07.15 දින සිට ඉදිරි කාලය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලංසුව සමානුපාතිකව ගණනය කර ලබාදීම සුදුසු බව යෝජනා කරනවා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා පෙ.ව.10.50 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා( එ.ජ.නි.ස.)</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැල 2022 වර්ෂයට බදු ලබා ගැනීමේ ජයග්‍රාහී දෙවන ලංසුකරු වන මඩිගේ අනුක්කනේ,සුනන්දපුර පදිංචි එම්.ජේ.අමීන් යන අය විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, එම අය වෙත 2022.07.15 දින සිට ඉදිරි කාලය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලංසුව සමානුපාතිකව ගණනය කර ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් හෙට්ටිපොල සතිපොලේ ගවමස් වෙළඳසැල 2022 වර්ෂයට බදු ලබා ගැනීමේ ජයග්‍රාහී දෙවන ලංසුකරු වන මඩිගේ අනුක්කනේ,සුනන්දපුර පදිංචි එම්.ජේ.අමීන් යන අය විසින් 2022.07.11 දාතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය සලකා, එම අය වෙත 2022.07.15 දින සිට ඉදිරි කාලය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලංසුව සමානුපාතිකව ගණනය කර ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>

මේ ව්‍යාපාරික ප්‍රජාව මට නිතර නිතර කියන කතාවක් තමයි නගරයේ වෙළඳසැල් වලින් බදු අයකරනවා, ප්‍රාදේශීය සභාවට ආදායමක් ලබාගන්නවා. නමුත් ඔවුන්ට බලපා තිබෙනවා විශේෂයෙන්ම මේ චූන් පාන් ප්‍රශ්නය. ඒ වාහන මේ භෝජනාගාර හා හෝටල් ඉදිරිපිට අලෙවි කිරීම නිසා ඒ ව්‍යාපාරවලට පාඩුවක් වෙලා තියෙනවා කියලා කිහිපදෙනෙක්ම මට කීවා. මේ ජංගම රථ නගරයෙන් බැහැරට ගන්න කියන්න කීවා. ඒක සාධාරණයි. මොකද ජංගම වෙළඳාම් රථවලින් ප්‍රාදේශීය සභාවට ආදායමක් ලැබෙන්නේ නෑ. නමුත් පෙර කී නගරයේ වෙළඳසැල් වලින් ප්‍රාදේශීය සභාවට ආදායමක් ලැබෙනවා. ඒ නිසා මේ ජංගම වෙළඳ රථ නගරයෙන් බැහැරට අරගෙන වෙළඳාම් කරන්න කියලා දැනුවත් කළොත් හොඳයි කියලා මම අදහස් කරනවා. ඔබතුමන්ලාත් ඒ අදහසට එකඟ ඇති.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.කේ. නිමල් ප්‍රේමසිරි දයානන්ද මහතා( එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මේක ඇත්ත. වරිපනම් ආදිය ගෙවලා ආදායමක් ලබාදෙන්නේ මේ කඩ හිමියෝ.නමුත් අපි මොන ක්‍රමවේදයක් යටතේද නගරයට එන්න එපා කියන්නේ. එහෙමනම් අපේ සේවකයෙක් හරහා දැනුවත් කරන්න වෙනවා ඒ අය නගරයට ආවොත් ලොකු ප්‍රශ්නයක් තියෙනවා කියලා මොකද , ප්‍රාදේශීය සභාවට ආදායමක් ලබා නොදෙන නිසා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.එම්.කමල්සිරි මහතා පෙ.ව.10.54 ට පමණ ගරු සභාවට පැමිණියා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

වෙළඳ සංගමය මැදිහත් වෙලා ඒ කටයුතු කරගන්න ඉඩ දෙමු. මම ඒ කාරණය ඉදිරිපත් කළේ ගරු මන්ත්‍රීමණ්ඩලය දැනුවත් කිරීම සඳහා.

## V. ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථ සම්බුද්ධ ශාසනවර්ධන කාර්ය සාධක සමිතියේ ස්තූතිය පළකිරීම.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

පඩුවස්නුවර ශාසානාරක්ෂක බලමණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී, දීගල්ල රේවත මධ්‍ය මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති මුණමල්දෙනිය ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථනයේ විහාරාධිපතිව වැඩ විසූ ශාස්ත්‍රපති නෙලිබැවේ පඤ්ඤාසාර ස්වාමීන්වහන්සේගේ ආදාහන පූජෝත්සවය වෙනුවෙන් හා හත් දවසේ දානමය පිංකම වෙනුවෙන් මූල්‍යමය හා භෞතික ආධාර ලබාදීමෙන් සහ සහභාගිත්වයෙන් එම කටයුත්ත සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ඔබතුමන් සහ ඔබ ප්‍රාදේශීය සභාව අප වෙත ලබා දුන් මාහැගි දායකත්වය වෙනුවෙන් අප විහාරස්ථ දායක සභාවේ ගෞරවනීය ස්තූතිය ඔබතුමන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සැමට මෙසේ පුද කරන්නෙමු. ඔබතුමන්ගේ සහ කාර්යය මණ්ඩලයේ සැමගේ සියළු කාර්යයන් සාර්ථක කරගැනීමට තෙරුවන්ගේ ආශිර්වාදය නොඅඩුව ලැබේවායි ප්‍රාර්ථනා කරමු. තෙරුවන් සරණයි.

**ඒ අනුව ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථ සම්බුද්ධ සාසනවර්ධන කාර්ය සාධක සමිතියේ ස්තූතිය පළකිරීම ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.**

## 04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල් දී ඇති යෝජනා

## I.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් පොල්තවාන ආදාහනාගාරය ගැසට් කිරීම සම්බන්ධව.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා -</u>**

සුසාන භූමි ආඥාපනතේ 3 වගන්තිය යටතේ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සැම සුසාන භූමියකම බලධාරියා පලාත් පාලන ආයතනය වේ. එබැවින් පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුදූකුඹුර ග්‍රාම නිළධාරී වසමේ පිහිටි පොල්තවාන ආදාහනාගාරය ප්‍රාදේශීය සභාවට අයත් නීත්‍යානුකූල ආදාහනාගාරයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම , සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති රංජිත් ආනන්ද බංඩාර මහතා -</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා-</u>**

සුසාන භූමි ආඥාපනතේ 3 වගන්තිය යටතේ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සැම සුසාන භූමියකම බලධාරියා පලාත් පාලන ආයතනය වේ. එබැවින් පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුදූකුඹුර ග්‍රාම නිළධාරී වසමේ පිහිටි පොල්තවාන ආදාහනාගාරය ප්‍රාදේශීය සභාවට අයත් නීත්‍යානුකූල ආදාහනාගාරයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව, ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව සුසාන භූමි ආඥාපනතේ 3 වගන්තිය යටතේ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය අනුව සැම සුසාන භූමියකම බලධාරියා පලාත් පාලන ආයතනය වේ. එබැවින් පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුදූකුඹුර ග්‍රාම නිළධාරී වසමේ පිහිටි පොල්තවාන ආදාහනාගාරය ප්‍රාදේශීය සභාවට අයත් නීත්‍යානුකූල ආදාහනාගාරයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## 06.කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

**2022.06.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා, පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>
2022.06.16දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී ඩී. නිමාලි දිල්හානි මෙය- (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>
2022.06.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එම්. පයිසර් මහතා - (ශ්‍රී.ල මු.කො.)</u>
2022.06.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>
2022.06.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022.06.16 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම, නිවාස සහ ප්‍රජා සංවර්ධනය,කාර්මික සේවා ,පරිසරය සහ පහසුකම් යන විෂයන් සම්බන්ධව උපදෙස් දීම සඳහා වන කාරක සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

**I. 2022 ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය)**
**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන01

| අය විෂය අංකය | වැය විෂය නාමයන් | 1 පොදු පරිපාලනය | 2 සෞඛ්‍ය සේවා | 3 භෞතික සැලසුම් මංමාවත් ඉඩම් | 4 ජල සේවා | 5 වෙනත් උපයෝගී සේවා | 6 සුභසාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 2409459.22 | 1414076.10 | 1397751.84 | 42440.00 | 145886.96 | 2814149.24 | 8223763.36 |
| 2 | ගමන් වියදම් | 14550.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 14550.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 413376.00 | 1542184.10 | 740950.00 | 10356.00 | 0.00 | 41050.00 | 2747916.10 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 3200.00 | 65050.00 | 56600.00 | 35000.00 | 439580.00 | 28150.00 | 627580.00 |
| 5 | ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 154683.99 | 19850.81 | 8180.00 | 971116.44 | 32638.05 | 23176.15 | 1209645.44 |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 2454.84 | 0.00 | 78.36 | 0.00 | 2533.20 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 307500.00 | 307500.00 |
| 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 47891.65 | 0.00 | 0.00 | 0.00 | 11972.91 | 59864.56 |
| | **පුනරාවර්ථන වැය එකතුව** | **2995269.21** | **3089052.66** | **2205936.68** | **1058912.44** | **618183.37** | **3225998.30** | **13193352.66** |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| 9 | ප්‍රාග්ධන වැය | 0.00 | 52200.00 | 0.00 | 0.00 | 0.00 | 4500.00 | 56700.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 10981.91 | 0.00 | 365.45 | 0.00 | 11347.36 |
| | **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **52200.00** | **10981.91** | **0.00** | **365.45** | **4500.00** | **68047.36** |
| | **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතුව** | **2995269.21** | **3141252.66** | **2216918.59** | **1058912.44** | **618548.82** | **3230498.30** | **13261400.02** |
| | තැන්පත් | 804339.75 | | | | | | 804339.75 |
| | වැට් | 0.00 | | | | | | 0.00 |
| | ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| | මුද්දර බද්ද | 0.00 | | | | | | 0.00 |
| | සේවක ණය | 412783.99 | | | | | | 412783.99 |
| | අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| | ණයහිමි | 0.00 | | | | | | 0.00 |
| | සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| | ආයෝජන | 30000000.00 | | | | | | 30000000.00 |
| | අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| | මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| | වෙනත් | 0.00 | | | | | | 0.00 |
| | **මුළු එකතුව** | **31217123.74** | | | | | | **44478523.76** |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**
2022 ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්. ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**
2022ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 ජුනි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**II. 2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය)**
**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 02

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 3341.00 | 91800.00 | - | - | - | 128250.00 | 223391.00 |
| 20 කුලී | - | - | 767275.00 | - | 1534816.00 | 1000.00 | 2303091.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 0.00 | 77050.00 | - | - | - | 2400.00 | 79450.00 |
| 40 සේවා සඳහා ගාස්තු | 0.00 | 569649.00 | 125679.00 | 93119.38 | - | 9005.00 | 797452.38 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 0.00 | 0.00 | 15070.00 | 0.00 | 861.00 | 928.00 | 16859.00 |
| 60 වෙනත් ආදායම් | 37471.35 | 19200.00 | 0.00 | 567422.75 | 0.00 | 320.00 | 624414.10 |
| 70වෙනත් ආධාර | 2163255.00 | 597450.00 | 1454990.32 | 42440.00 | 137460.00 | 2600839.15 | 6996434.47 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **2204067.35** | **1355149.00** | **2363014.32** | **702982.13** | **1673137.00** | **2742742.15** | **11041091.95** |
| ප්‍රාග්ධන ආධාර | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **2204067.35** | **1355149.00** | **2363014.32** | **702982.13** | **1673137.00** | **2742742.15** | **11041091.95** |
| තැන්පත් | 175727.83 | | | | | | 175727.83 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 11766.00 | | | | | | 11766.00 |
| සේවක ණය | 464019.50 | | | | | | 464019.50 |
| අත්තිකාරම් | 0.00 | | | | | | 0.00 |
| ණය ගැති | 128320.59 | | | | | | 128320.59 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 54615.00 | | | | | | 54615.00 |
| **මුළු එකතුව** | **834448.92** | | | | | | **11875540.87** |

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**
2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.
**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්. ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**
2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.
**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**
2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.
**ඒ අනුව 2022 ජුනි මස ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## III. 2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව)

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන03

| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය | මාසය මුලදී ඉදිරියට ලැබීම් | මාසය තුළ බිල් කිරීම් | ලැබිය යුතු මුළු ආදායම | මාසය තුළ ලද ආදායම | මාසයට අදාල කලින් ලැබූ ආදායම | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය | ඉදිරියට ගෙන යන හිඟය | ඉදිරියට ලැබීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| | | | | | (1+3) | | | ( 2-6) | | | 4 - (5+6) | (7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 153449.77 | 908963.74 | 426643.26 | 580093.03 | 9831.00 | 628500.48 | 280463.26 | 353152.69 | 0.00 | 294644.72 | 633615.95 |
| 2 | අක්කර බදු 1/12 | 23676.09 | 4955.00 | 7326.25 | 31002.34 | 1710.00 | 3829.50 | 1125.50 | 3909.00 | 70.00 | 29371.84 | 5034.50 |
| 3 | කඩ කුලී 3/22 | 329510.00 | 51042.34 | 737500.00 | 1067010.00 | 767275.00 | 35702.34 | 15340.00 | 45027.34 | 0.00 | 3090600.00 | 0.00 |
| 4 | වත්කම් බදු 5/23 | 1125456.00 | 12630.00 | 1141116.00 | 2266572.00 | 969445.00 | 3430.00 | 9200.00 | 12650.00 | 0.00 | 1306347.00 | 21850.00 |
| 5 | ජල ගාස්තු 4/62 | 965439.38 | 49394.71 | 470638.00 | 1436077.34 | 567422.75 | 16108.78 | 33285.93 | 16759.56 | 104773.25 | 764532.16 | 50001.79 |
| 6 | ව්‍යාපාර බදු 2/16 | 0.00 | 0.00 | 88800.00 | 88800.00 | 88800.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/14 | 0.00 | 0.00 | 3000.00 | 3000.00 | 3000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 24000.00 | 24000.00 | 24000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | විශේෂ බලපත්‍ර ගාස්තු2/34 | 0.00 | 0.00 | 53050.00 | 53050.00 | 53050.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | එකතුව | 2597531.24 | 1026985.79 | 2952073.51 | 5549604.71 | 2484533.75 | 687571.10 | 339414.69 | 431498.59 | 104843.25 | 5485495.72 | 710502.24 |

ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා

2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්. ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**

2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජුනි මස ප්‍රා.ස.07 (හිඟ ආදායම් වාර්තාව) ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**IV. 2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න.**

## උපලේඛන 04

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | | | මාසික ආදායම් පුරෝකථන | | | අය වී ඇති ආදායම 2022 ජුනි | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9(7+8) |
| වරිපනම් ( 1/11) | 1785000 | 0 | 1785000 | 295000 | 145500 | 440500 | 1004296.98 | 2731 | 1007027.98 |
| අක්කර බදු ( 1/12 ) | 50000 | 0 | 50000 | 8000 | 5000 | 13000 | 2908 | 680 | 3588 |
| කසල බදු(2/13) | 1000 | 0 | 1000 | 200 | 50 | 250 | 13500 | 0 | 13500 |
| කර්මාන්ත බදු(2/16/i) | 50000 | 0 | 50000 | 0 | 0 | 0 | 23500 | 3000 | 26500 |
| ඇතැම් ව්‍යාපාර බදු(2/16/iii) | 1000 | 0 | 1000 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ව්‍යාපාර බදු ( 2/16/ii ) | 2000000 | 0 | 2000000 | 0 | 0 | 0 | 944400 | 88800 | 1033200 |
| බලපත්‍ර ගාස්තු ( 2/31/i ) | 1400000 | 0 | 1400000 | 10000 | 5000 | 15000 | 603383.15 | 24000 | 627383.15 |
| විශේෂ බල:ගාස්තු(2/31/ii) | 125000 | 0 | 125000 | 0 | 0 | 0 | 12950 | 53050 | 66000 |
| කඩ කුලී ( 3/22 ) | 8350800 | 0 | 8350800 | 1391800 | 695900 | 2087700 | 3605734.81 | 767275 | 4373009.81 |
| ජංගම අලෙවි කුටි( 3/22-i) | 297000 | 0 | 297000 | 0 | 0 | 0 | 262200 | 0 | 262200 |
| රථගාල් ගාස්තු(3/43/3) | 300000 | 0 | 300000 | 60000 | 30000 | 90000 | 81600 | 3600 | 85200 |
| ජල ගාස්තු(4/62,64) | 5800000 | 0 | 5800000 | 966000 | 483000 | 1449000 | 2353050.2 | 567422.75 | 2920472.95 |
| සතිපොල බදු ( 5/22 ) | 8470000 | 0 | 8470000 | 1120000 | 590000 | 1710000 | 3198380 | 563590 | 3761970 |
| බදු කුලී ( 5/23 ) | 8214535 | 0 | 8214535 | 1642910 | 821450 | 2464360 | 11204055 | 969445 | 12173500 |
| විනෝද බදු ( 6/15 ) | 400000 | 0 | 400000 | 75000 | 35000 | 110000 | 265455 | 128250 | 393705 |
| ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/2) | 160000 | 0 | 160000 | 30000 | 15000 | 45000 | 0 | 1000 | 1000 |
| එකතුව | 38889943 | 0 | 38889943 | 5598910 | 2825900 | 8424810 | 51269951.4 | 3172843.75 | 54442795.2 |

_2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)**

2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීනී එල්.එම්. ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)**

2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා**

2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 අගෝස්තු මස මාසික ආදායම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

## V. 2022 ජූලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව

**උපලේඛන 05 සඳහා අනිත් පිට බලන්න.**

# උපලේඛන 05

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය / ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 93270132.00 | | 93270132.00 | 46635066.00 | 7772511.00 | 54407577.00 | 16155566.19 | 8223764.00 | 24379330.19 | 30028246.81 |
| 2 | ගමන් වියදම් | 1064000.00 | | 1064000.00 | 460000.00 | 90000.00 | 550000.00 | 82780.00 | 14550.00 | 97330.00 | 452670.00 |
| 3 | සැපයුම් හා උපකරණ | 12263000.00 | 1700000.00 | 13963000.00 | 4888000.00 | 450000.00 | 5338000.00 | 2911378.70 | 2747916.00 | 5659294.70 | -321294.70 |
| 4 | ප්‍රග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 14040000.00 | | 14040000.00 | 9400000.00 | 900000.00 | 10300000.00 | 3009123.23 | 627580.00 | 3636703.23 | 6663296.77 |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 11474000.00 | 20000.00 | 11494000.00 | 5951000.00 | 950000.00 | 6901000.00 | 1728770.60 | 1209646.00 | 2938416.60 | 3962583.40 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | 167360.00 | | 167360.00 | 50402.40 | 17000.00 | 67402.40 | 72256.55 | 2533.00 | 74789.55 | -7387.15 |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 6138000.00 | | 6138000.00 | 2538000.00 | 600000.00 | 3138000.00 | 183595.00 | 307500.00 | 491095.00 | 2646905.00 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 968040.00 | | 968040.00 | 458000.00 | 70000.00 | 528000.00 | 107720.12 | 59865.00 | 167585.12 | 360414.88 |
| 9 | උපකරණ වැය | 34425000.00 | | 34425000.00 | 18330000.00 | 2800000.00 | 21130000.00 | 1359032.49 | 56700.00 | 1415732.49 | 19714267.51 |
| 10 | ණය ආපසු ගෙවීම් | 2196000.00 | | 2196000.00 | 685858.83 | 19000.00 | 704858.83 | 250000.00 | 11347.00 | 261347.00 | 443511.83 |
| | **එකතුව** | 176005532.00 | | 176005532.00 | 89396327.23 | 13668511.00 | 103064838.23 | 26405958.56 | 13261401.00 | 39667359.56 | 63397478.67 |

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

**<u>2022</u>** ජුලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව සභා සම්මත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.ජ.පෙ.)</u>**

2022 ජුලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී එල්.එම්. ගුණරත්මැණිකා මහත්මිය - (එ.ජා.ප.)</u>**

2022 ජුලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති බී.එම්.ධර්මසේන බමුණුසිංහ මහතා</u>**

2022 ජුලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත වූ බව දන්වා සිටිනවා.

**ඒ අනුව 2022 ජුලි මස මාසික වියදම් පුරෝකථන වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**08.රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත් ,2022 වර්ෂයේ ජුලි මස මහ සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. පෙ.ව.11.10 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සටහන් කලේ :ඩබ්.එම්.එන්.ප්‍රියදර්ශනී ,සංවර්ධන නිලධාරී.

වාර්තා කලේ :එච්.ඒ.ජී.නිශ්ශංක,ලේකම්,පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.